**මිනින්දෝරු දෙපාර්තමේන්තුව**
**ලියාපදිංචි බලයලත් මිනින්දෝරු වරුන් මගින් සිදුකරනු ලබන 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ කැඩැස්තර මැනුම් සඳහා වූ කොන්ත්‍රාත්තුවේ නියම හා කොන්දේසි-2015**

## 1. නියම

| | | |
|---|---|---|
| සේවාදායකයා | :- | සර්වේයර් ජනරාල් |
| මිනින්දෝරු | :- | ලියාපදිංචි බලයලත් මිනින්දෝරු |
| මි.අ | :- | මිනින්දෝරු අධිකාරී |
| ජො.මි.අ. | :- | ජොෂ්ඨ මිනින්දෝරු අධිකාරී |
| ඉ.වි.ලැ | :- | ඉඩම් විස්තර ලැයිස්තු |

දැනට පවතින සහ වරින් වර නිකුත් කරනු ලබන දෙපාර්තමේන්තු මැනුම් රෙගුලාසි සහ කැඩැස්තර මැනුම් උපදෙස් වලට අනුකූලව මැනීම සහ ඇඳීම සිදු කළ යුතුය. සියලුම මැනුම් (SLD 99) ජාතික බණ්ඩාංක පද්ධතියට සම්බන්ධ කළ යුතුය. එසේම කැඩැස්තර සිතියම්, කැඩැස්තර පිඹුරු සහ ඉඩම් විස්තර ලැයිස්තු දෙපාර්තමේන්තු මැනුම් රෙගුලාසි සහ දෙපාර්තමේන්තුව මගින් සපයනු ලබන ආංකික දත්ත පිළිවිතර වලට අනුව සිදු කළ යුතු වේ. කැඩැස්තර සිතියම්, ඉ.වි.ලැ. සහ හිමිකම් සහතික නිකුත් කළ හැකි සියලුම කැබලි සඳහා අවශ්‍ය කැඩැස්තර පිඹුරු වල ආංකික දත්ත දෙපාර්තමේන්තු මැනුම් රෙගුලාසි 24 පරිච්ඡේදයේ පරිදි සකස් කළ යුතු අතර එම දත්ත ඇතුලත් සංයුක්ත තැටි අධීක්ෂණය භාර මි.අ. වෙත පරීක්ෂා කිරීම සඳහා භාර දිය යුතුය. මි.අ. විසින් අදාල සිතියම් පරීක්ෂා කර පිළිගැනීමෙන් පසු කැඩැස්තර සිතියමේ සහ ඉ.වි.ලැ වල අවසාන මුද්‍රිත පිටපත ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේදී මුද්‍රණය කළ යුතුය.
ඉන් අනතුරුව ජො.මි.අ. විසින් එය පරීක්ෂා කර සම්මත කරනු ලබන අතර, සම්මත කිරීමට පෙර එහි කිසියම් සංශෝධනයක් ඇති බව දක්නට ලැබුණහොත් මිනින්දෝරු වරයා විසින් එය නිවැරදි කළ යුතුය. එසේම සේවාදායකයාගෙන් ලබා ගනු ලබන සියලුම ද්‍රව්‍ය / ලේඛණ භාර දී ඒ සඳහා නිශ්කාෂණ ලබා ගත යුතුය.

## 2. ගාස්තු

**2.1 රක්ෂිත බිම්, ජල මාර්ග සහ පුද්ගලික/රජයේ මාර්ග හැර මැනුම් කරන සියලුම කැබලි සඳහා**

(i) කැබැල්ලක ප්‍රමාණය හෙක්ටයාර 0.0150 දක්වා - රු. 2800/-
කැබැල්ලක ප්‍රමාණය හෙක්ටයාර 0.0250 දක්වා - රු. 3000/-
කැබැල්ලක ප්‍රමාණය හෙක්ටයාර 0.1 දක්වා - රු. 3600/-
කැබැල්ලක ප්‍රමාණය හෙක්ටයාර 0.4 දක්වා - රු. 5000/-
කැබැල්ලක ප්‍රමාණය හෙක්ටයාර 1.0 දක්වා - රු. 6000/-
කැබැල්ලක ප්‍රමාණය හෙක්ටයාර 2.0 දක්වා - රු. 7500/-

ඉහත අගයන්ට අතරමැදි අගයන් ගන්නා කැබලි සඳහා වැඩි වන ප්‍රමාණයන් අනුපාතිකව ගණනය කරනු ලබයි.

උදා 1 : කැබැල්ලේ ප්‍රමාණය හෙක්ටයාර් 0.1075 නම්, ගාස්තුව

= රු. 3600/- + රු.(0.1075 - 0.1) x (5000-3600) / (0.4 - 0.1) = රු. 3,635/-

(ii) කැබැල්ලේ ප්‍රමාණය හෙක්ටයාර 2 ට වැඩි වන විට, ස්ථාවර ගාස්තුව සමඟ වැඩි වන වර්ග ප්‍රමාණයට ගාස්තුව ගණනය කරනු ලැබේ.

| | |
|---|---|
| ස්ථාවර ගාස්තුව | රු. 7500/- |
| හෙක්ටයාර 2 ට වැඩි වන කැබලි සඳහා වැඩි වන හෙක්ටයාර එකකට | රු. 1000/- |

උදා 2 : (කැබැල්ලේ ප්‍රමාණය හෙක්ටයාර් 20.4 නම්)

| | | |
|---|---|---|
| ස්ථාවර ගාස්තුව | | = රු. 7500/- |
| හෙක්ටයාර 2 සිට 20.4 දක්වා | = රු. 1000 x (20.4-2.0) | = රු. 18400/ - |
| | | රු 25900/- |

**2.2 සියලුම ජල මාර්ග සහ පුද්ගලික/රජයේ මාර්ග කැබලි සඳහා**

වර්ග මීටර් 4000 දක්වා කැබැල්ලකට රු.1000/- හා වර්ග මීටර් 4000 ට වැඩි කැබලි සඳහා රු. 1500/-

**2.3 සියලුම ජල මාර්ග දිගේ වෙන් කළ බිම් සහ රක්ෂිත කැබලි සඳහා**

ඉහත 2.1 පරිදි වූ ගාස්තු ගණනය කර ඉන් 50% ලෙස ගෙවීම් ගණනය කරනු ලැබේ.

**2.4 කැඩැස්තර සිතියම් ප්‍රදේශ තුල අතිරේක මැනුම් සඳහා**

මැනුමේදී සිදුවූ වරදක්/අතපසුවීමක් නිසා නොවන අතිරේක මැනුම් සඳහා පමනක් අමතර ගාස්තු ගෙවනු ලබන අතර එහිදී ඉහත 2.1 පරිදි වූ ගාස්තු ගණනය කර ගෙවීම් ගණනය කරනු ලැබේ. නිරවුල් කිරීමේ කොමසාරිස් විසින් ඉල්ලුම් කරනු ලබන අතිරේක මැනුම් සඳහා වූ අවම ගාස්තුව රු. 7000/- කි.

**2.5 සභාධිපත්‍ය දේපල මැනුම් සඳහා**

සභාධිපත්‍ය දේපල මැනුම් කිරීමේදී ද ඉඩම් කැබලි සඳහා ඉහත 2.1 පරිදි වූ ගාස්තු ගණනය කරනු ලැබේ. එහි සභාධිපත්‍ය ඒකකයන් සඳහා රු. 1500/- ක් ද අමතරව පොදු සභාධිපත්‍ය ඒකක සඳහා 750/- ක්ද වශයෙන් ගෙවීම් සිදු කරයි.

**2.6 පැරණි මැනුම් කැබලි නැවත නියැකීම සඳහා**

කලින් කරන ලද මැනුම් නැවත නියැකීමේදී ද ඉහත ඉහත 2.1 පරිදි වූ ගාස්තු ගණනය කර එම ගාස්තු ප්‍රමාණයෙන් 15% ක ප්‍රමාණයක් වේ.

**2.7 පැරණි මැනුම් පිඹුරු කඩඉම් සිතියම් ලෙස පරිවර්තනය කිරීම සඳහා**

කැඩැස්තර මැනුම් ප්‍රදේශ තුල වූ පැරණි ව්‍යවස්ථාපිත පිඹුරු කැඩැස්තර සිතියම් ලෙස පරිවර්තනය කිරීමේ දී පැරණි පිඹුරු සහ ඉඩම් විස්තර ලැයිස්තු තුල අදාල සටහන් යෙදීම සඳහා කැබැල්ලකට රුපියල් 50/= බැගින් ගාස්තුවක් ගෙවනු ලැබේ. එසේ වුවද එම පැරණි පිඹුරු වට මායිම පොළොවේ පිහිටුවා මනින අවස්ථාවකදී වර්ග ප්‍රමාණය අනුව ඉහත 2.1 පරිදි ගාස්තුව ගණනය කර ඉන් 50% ක් ලෙස ගෙවීම් කරනු ඇත.

**2.8** භූ විෂමතාවය මත හෝ ඉඩම් පරිහරණ තත්වයන් (විශාල කැලෑ, වගුරු බිම්) මත දුෂ්කර ප්‍රදේශ ලෙස සර්වේයර් ජනරාල් විසින් තීරණය කරන ලද ප්‍රදේශ සඳහා ඉහත 2.1 සිට 2.4 සහ 2.7 මැනුම් ගාස්තුව උපරිම ලෙස 10%කින් වැඩිකර ගෙවීමට ඉල්ලීම් අනුව සලකා බලනු ඇත.

## 3. බදු

**(i) එකතු කළ අගය මත බදු (VAT) :-**

වැට් බදු අයකරනු ලබයි නම් ඒ සඳහා වැට් අංකය ඇතුලත් විධිමත් බදු ඉන්වොයිස් පත්‍රයක් (Tax Invoice) ඉදිරිපත් කළ යුතුය.

**(ii) මුද්දර බදු :-**

රු. 25,000/- ඉක්මවා ගෙවීම් කරන විට ඔබ විසින් ලබා දෙනු ලබන ලදු පත සඳහා රු.25/- ක මුද්දර අවලංගු කළ යුතුවේ.

## 4. ගෙවීම

**i.** වැඩ පවරන ලද කලාපයක වැඩ සතුටුදායක ලෙස නිම කිරීමෙන් පසු පමණක් ගිවිසාගත් අගයන් ප්‍රකාරව ගෙවීම් සිදු කෙරේ. අත්තිකාරම් මුදල් ගෙවීමක් හෝ වෙනත් කිසිදු ගෙවීමක් කොන්ත්‍රාත් පැවරීමේදී සිදු නොකරයි. සම්මත කරන ලද පිඹුරක නිරවුල් කිරීමේ කොමසාරිස් වරයා විසින් හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 13 වන වගන්තිය අනුව වන විමර්ශනයේ දී පෙන්වා දෙනු ලබන යම් අතපසු වීමක් නිසා සිදු කළ යුතු සංශෝධනයක් වේ නම්, අදාල මිනින්දෝරුවරයා විසින් අය කිරීමකින් තොරව එම සංශෝධනය කළ යුතු වේ.

**(ii)** (අ) ගිවිසුම් ප්‍රකාරව වැඩ අවසන් කිරීමේ නියමිත දිනට හෝ ඊට ප්‍රථම මි.අ. සහ ජො.මි.අ. විසින් නියම කරන ලද සංශෝධන ද (ඇත්නම්) සිදුකර සම්පූර්ණයෙන් වැඩ නිම කරන ලද කැඩැස්තර සිතියම් ජො. මි.අ. වෙත ලැබිය යුතු අතර එම දිනට පසු ප්‍රමාද වන සෑම දිනක් වෙනුවෙන්ම මැනුම් ගාස්තු මුළු මුදලින් 0.5% ක් බැගින් දින 30 දක්වා ප්‍රමාද ගාස්තු අයකරනු ලැබේ. දින 30 කටත් වඩා ප්‍රමාදවූ වැඩ සඳහා වන මුළු ප්‍රමාද ගාස්තුව සර්වේයර් ජනරාල්වරයා විසින් තීරණය කරනු ඇත.

(ආ) තෝරා ගත් ගමක/ ග්‍රා.නි.කොට්ඨාශයක ඉඩම් කට්ටි 100 ක් හෝ හෙක්. 50ක් පමණ වන සේ වූ කලාපයක සිදු කළ යුතු මැනුම් වැඩ පැවරීම වරකදී සිදු කරනු ලබන අතර, ගිවිසුම් අත්සන් කරනු ලබන දින සිට මාස එකක කාලයක් තුලදී අදාල කලාපය තුල ඉඩම් කට්ටි 50 ක් හෝ හෙක්ටයාර 25 ක් මැන සිතියම් නියමිත ප්‍රමිතියට සම්පූර්ණ කිරීමේ පදනම මත එම කලාපයේ වැඩ නිම කළ යුතු දිනය සඳහා ගිවිසුම්ගත වනු ඇත. වැඩ පවරන ලද කලාපයේ මැනිය යුතු ඉඩම් කට්ටි ප්‍රමානය 100 කට වඩා වැඩිවන බව මිනින්දෝරුවරයාගේ ක්ෂේත්‍ර විමර්ශනයේදී පෙනීයන්නේ නම් ඒ බව වහාම අධීක්ෂන නිලධාරියා වෙත දන්වා සිටිය යුතු අතර අධීක්ෂන නිලධාරී විසින් ඒ පිළිබඳ විමර්ශනය කොට ඉඩම් කට්ටි 100 පමන මැන සිතියමක් සකස් කිරීමට සුදුසු පරිදි උපදෙස් ලබාදෙනු ඇත. ඒ අනුව සිතියමක කැබලි සංඛ්‍යාව වැඩිවීම මත පමණක් වැඩ අවසන් කිරීමේ දිනය දීර්ඝ නොකරනු ලැබේ. කෙසේ වුවද ගිවිසගත් කාලය තුලදි ඉඩම් කට්ටි 100 කට වඩා වැඩි ප්‍රමාණයක් වුවද මැන සිතියම් සකස් කිරීමට මිනින්දෝරුවරයාට හැකියාව ඇත්නම් මුල් ගිවිසුම සංශෝධනයකින් තොරව වැඩ නිම කිරීමට මිනින්දෝරුවරයාට ඉල්ලා සිටිය හැක. එම ඉල්ලීම මිනින්දෝරුවරයා විසින් ලිඛිතව ජො.මි.අ. වෙත ක්ෂේත්‍ර විමර්ශනය නිම කළ වහාම ඉදිරිපත් කළ යුතුය.

(ඇ) අනපේක්ෂිත තත්වයන් මත නියමිත දිනට වැඩ අවසන් කිරීමට නොහැකි වන අවස්ථා වලදී එම ප්‍රමාදයට පිළිගත හැකි හේතුන්(ඇතොත්) <u>ගිවිසුම්ගත වැඩ අවසන් කළයුතු දිනට පෙර</u> අධීක්ෂණය භාර මි.අ./ ජො. මි.අ. හා ජො. මි.අ. (දිස්ත්‍රික්) මගින් පළාත් සර්වේයර් ජනරාල් වෙත නියමිත ආකෘති පත්‍රය මගින් දැනුම් දිය යුතුය. මෙසේ ඉදිරිපත්වන ඉල්ලීම් සලකා බැලීමෙන් පසු මිනින්දෝරු වරයාට වගකිව නොහැකි හේතු සඳහා පමනක් උපරිම වශයෙන් දින 14 දක්වා දින දීර්ඝයක් ලබාදීම පළාත් සර්වේයර් ජනරාල් විසින් සිදු කරනු ඇත. කෙසේ වුවද ඊට වැඩි කාලයක් ප්‍රමාදවීම මත ඉහත ක්‍රමවේදය අනුගමනය කරමින් පළාත් සර්වේයර් ජනරාල්ගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කරන අයදුම්පත් සඳහා දින දීර්ඝයන් ලබාදීම පිළිබඳ සර්වේයර් ජනරාල් විසින් තීරණය කරන අතර මේ සම්බන්ධයෙන් සර්වේයර් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

**iii** මෙම කාර්යය සඳහා වන ශ්‍රමය, ද්‍රව්‍යය, ප්‍රවාහනය, උපකරණ, ලිපිද්‍රව්‍ය, ආංකික මාධ්‍ය යනාදිය සඳහා වන වියදම මිනින්දෝරු තැන විසින් දැරිය යුතුය. සම්පූර්ණ කරන ලද පිඹුරුපත් වල අවසාන මුද්‍රිත පිටපත සඳහා සහ මායිම් ගල් සඳහා වූ පිරිවැය මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් දරනු ඇත.

## 5. කොන්දේසි

**5.1** වැඩ අරමුණු:

(i) වැඩ පැවරීමේ ලිපිය දිස්ත්‍රික් ජො.මි.අ. විසින් නිකුත් කරනු ලබන අතර, එම ලිපියේ සඳහන් නියමිත දිනට හෝ ඊට පෙර අදාල කාර්යය පිළිගැනීමේ ලිපිය මිනින්දෝරුවරයා විසින් දිස්ත්‍රික් ජ්යෙ.මි.අ. වෙත භාර දී, ඔහු/ඇය සමග ගිවිසුම් අත්සන් කර අප්‍රමාදව වැඩ ආරම්භ කළ යුතුය.

(ii) වැඩ පවරන ලද කලාපයේ ක්ෂේත්‍ර වැඩ සඳහා කාර්යය සැලැස්මක් මිනින්දෝරු වරයා විසින් සකස් කර එය අධීක්ෂණය භාර මි.අ.ගේ අනුමැතියට ඉදිරිපත් කළ යුතුය.ඉන් අනතුරුව එම අනුමත වැඩසටහන පිළිගෙන ඉහත 1 ඡේදයේ සඳහන් නියම අනුව කටයුතු කළ යුතුය.

(iii) වැඩ සපයන කලාපය තුල වූ මැනීමට නියමිත සියලුම ඉඩම් කැබලි වල මායිම් වෙන වෙනම මැනිය යුතු අතර සෑම ඉඩම් කැබැල්ලකම හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය ක්ෂේත්‍ර සටහන් වල සඳහන් කළ යුතුය. ඉ.වි.ලැ.වේ හිමිකම් කියන්නාගේ නම පමනක් සඳහන් කිරීම ප්‍රමාණවත්ය. යම් ඉඩම් කොටස්වල හිමිකම් කියන්නන් සොයා ගැනීම අපහසු අවස්ථාවකදී ඒ බවට කලාපයට අනුයුක්ත කරන ලද විමර්ශන නිළධාරී සහ කොට්ඨාශයේ ග්‍රාමනිළධාරීගේ ලිඛිත තහවුරුවක් ලබාගෙන එය පිඹුර පරීක්ෂා කරන අවස්ථාවේදී මි.අ. වෙත ගොනුව සමග ඉදිරිපත් කළ යුතුය.

(iv) මිනින්දෝරුවරයා ඉහත 4 (ii)(ආ) අනුව තීරණය වූ ප්‍රදේශයක් මැන නියමිත ප්‍රමිතියට අනුව වැඩ අවසන් කර භාර දෙන කැඩැස්තර සිතියම උපරිම දින 5 ක් තුලදී අධීක්ෂණය භාර මි.අ. විසින් පරීක්ෂා කර සංශෝධන (ඇත්නම්) සඳහා භාර දෙන අතර, මි.අ. අත්සන් කොට ජො. මි.අ. වෙත ඉදිරිපත් කරන එම සිතියම උපරිම දින 5ක් තුලදී පරීක්ෂා කර සංශෝධන(ඇත්නම්) සඳහා ආපසු භාර දෙනු ඇත. එහිදි කැඩැස්තර සිතියම සංශෝධනය කිරීම සඳහා ගත කරන කාලය මිනින්දෝරුවරයා වෙත ගිණුම්ගත වන අතර අධීක්ෂණ නිළධාරින් විසින් පිඹුරු පරීක්ෂා කිරීම සඳහා ගත කරන කාලය මිනින්දෝරුවරයා වෙත ගිණුම් ගත කරනු නොලැබේ.

(v) මිනින්දෝරු වරයා විසින් අනුමත වැඩ සටහනට අනුව ගත කරන කාලයට අනුරූප වන ලෙස වූ ප්‍රමාණවත් සතුටුදායක ප්‍රගතියක් පෙන්නුම් කළ යුතුය. අනවශ්‍ය ලෙස වැඩ ප්‍රමාද වන්නේ නම් අදාල ජො.මි.අ/මි.අ ගේ පෞද්ගලික අවධානය ඒ සම්බන්ධව යොමු කරනු ඇත. එසේ සතුටුදායක ප්‍රගතියක් නොපෙන්වන අවස්ථා වලදී, ගෙවීමකින් තොරව, 5.2 ඡේදයේ සඳහන් සියලුම කොන්දේසි වලට යටත්ව වැඩ අවසන් කරනු ඇත.

(vi) සේවා දායකයා හෝ ජ්‍යෝ. මි.අ. විසින් නම් කරනු ලබන මි.අ. වරයෙකු විසින් මෙම මැනුම් කටයුතු වල පරිපාලනය සිදු කර ක්ෂේත්‍ර වැඩ අධීක්ෂණය හා වැඩ පරීක්ෂා කිරීම සිදු කරනු ලබයි. අදාල දිස්ත්‍රික් ජ්‍යෝ.මි.අ වරයාගේ හා ජ්‍යෝ.මි.අ (බිම්සවිය) හෝ සේවා දායකයා විසින් නම් කරනු ලබන වෙනත් ජ්‍යෝ.මි.අ ගේ සමස්ථ අධීක්ෂණය යටතේ උක්ත කාර්යය සිදු කළ යුතු අතර පරිපාලන හා ගෙවීම් කටයුතු දිස්ත්‍රික් ජ්‍යෝ.මි.අ විසින්ද තාක්ෂනික කටයුතු අධීක්ෂණය හා පිඹුරු සම්මත කිරීම ජ්‍යෝ.මි.අ (බිම්සවිය) හෝ නම් කළ ජ්‍යෝ.මි.අ. විසින්ද සිදු කරනු ඇත.

(vii) ගිවිසුම් ගත ක්‍ෂෙත්‍ර මැනුම් කටයුතුවල අදාල ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයා හැර වෙනත් අය යෙදවීම නොකල යුතු අතර එසේ වන බව තහවුරු වුවහොත් ගාස්තු ගෙවීමකින් තොරව 5.2 ඡේදයේ සදහන් සියලුම කොන්දේසි වලට යටත්ව වැඩ අවසන් කරනු ඇත.

(viii) මෙහිදී යොදා ගැනීමට නියමිත පූර්ණමාන, පරිගණක හා ඊට අදාල සියලුම උපාංග මිනින්දෝරුවරයා විසින්ම සපයා ගත යුතුය. භාවිත කරනු ලබන පූර්ණමාන ආරම්භක වැඩ පැවරීමට අදාල ගිවිසුම් අත්සන් කිරීමට ප්‍රථම ප්‍රමාණ ශෝධනය (Calibrate) කර තිබිය යුතු අතර, එම වාර්තාව දිස්ත්‍රික් ජ්‍යෝ.මි.අ වෙත ඉදිරිපත් කළ යුතුය. කේෂ්ත්‍ර වැඩ කරන කාලයේදී පසුගිය වසරතුල නියමිත ප්‍රමාණ ශෝධනය කර ඇතිදැයි ජ්‍යෝ.මි.අ./ මි.අ. විසින් පරීක්ෂා කරනු ඇත.

(ix) සියලුම ක්ෂේත්‍ර සටහන් දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන ක්ෂේත්‍ර පොත් වල දෙපාර්තමේන්තු මැනුම් රෙගුලාසි වලට අනුව තැබිය යුතු අතර, පිඹුරුපත් වල අවසන් මුද්‍රණ පිටපත් දෙපාර්තමේන්තුව මගින් සපයන නියැකීමේ පත්‍ර වල සිදු කල යුතුය.

(x) ගිවිසුම්ගත ප්‍රමාණය තුල ඇති නියමිත ඉඩම් මායිම් ගල් දමා මැන පිඹුරු සකස් කර, පැරණි පිඹුරු සංශෝධනය කර ඉහත 1 ඡේදයේ සදහන් නියමයන්ට අනුව වැඩ නිම කර භාර දී නිශ්කාෂණ ලබා ගත යුතුය. නියමිත ප්‍රමිතියට අනුව නියමිත කාලය තුල සතුටුදායක ලෙස වැඩ නිම කළ සිතියම් ජ්‍යෝ.මි.අ. වෙත භාර දෙන මිනින්දෝරුවරුන් සදහා නව කොන්ත්‍රාත්තුවක් හා නව ගිවිසුමක් යටතේ වැඩ ලබාදීමට දිස්ත්‍රික් ජ්‍යෝ.මි.අ. විසින් තීරණය කළ හැකි අතර ඒ සදහා පළාත් සර්වේයර් ජනරාල්ගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. අවශ්‍ය වුවහොත් පළාත් සර්වේයර් ජනරාල්ගේ අනුමැතිය මත වැඩ අවසන් කළ යුතු දිනය සංශෝධනය කිරීමට දිස්ත්‍රික් ජ්‍යෝ.මි.අ. ට අවකාශ ඇත. ඊට අනුකූලව ගිවිසුමද සංශෝධනය කරනු ඇත.

(xi) වැඩ සපයනු ලබන කලාපය තුල කලින් නිම කළ ලද ව්‍යවස්ථාපිත පිඹුරු පිළිබඳව මිනින්දෝරුවරයා විසින් පූර්ව අධ්‍යනයක් කල යුතු අතර ඒවායින් ආවරණය වූ බිම් කැබලි සඳහා කටයුතු කිරීමේ දී සර්වේයර් ජනරාල්ගේ කේෂ්ත්‍ර මණ්ඩල චක්‍රලේඛ 01/2011 සහ 01/2011(i) අනුගමනය කළ යුතුය. මේ සම්බන්ධ වැඩි දුර උපදෙස් අධීක්ෂණ නිළධාරී විමසා ලබා ගත යුතුය.

(xii) මෙම වසරේ හොද ප්‍රගතියක් පෙන්වනු ලැබූ සහ සාර්ථකව වැඩ නිමකරන බලයලත් මිනින්දෝරුවරුන් වෙත ඉදිරි වර්ෂය සදහා වැඩ පැවරීමටද සර්වේයර් ජනරාල් විසින් සලකා බලනු ඇත.

**5.2** කාර්ය සාධන බැඳුම්කරය:

සිදු කරනු ලබන වැඩවල කාර්ය සාධනය විධිමත්ව පාලනය කිරීම වෙනුවෙන් රු. 20,000/- ක් වටිනා මුදල් තැන්පතුවක් හෝ පිළිගත් බැංකුවක මාස 04 කට වලංගු වන බැදුම්කරයක් අදාල මිනින්දෝරු වරයා විසින් ගිවිසුම අත්සන් කිරීමට පෙරාතුව, දිස්ත්‍රික් ජ්‍යෝෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙත ලබා දිය යුතුය. වැඩ සම්පූර්ණයෙන් අවසන් වී මසක් යනතුරු එම බැදුම්කරය දෙපාර්තමේන්තුව භාරයේ තබා ගන්නා අතර, මිනින්දෝරු වරයාගේ වැඩ සම්බන්ධයෙන් පහත සදහන් යම් විෂමතාවයක් හෝ රජයට යම් අලාභයක් සිදු වුවහොත් මෙම බැදුම්කරයම රජයේ ආදායමට බැර කිරීමට සේවා දායකයාට බලය පැවරෙනු ඇත.

අ). භාර දෙනු ලැබූ ක්ෂේත්‍ර පොත් හා වෙනත් ලේඛණ ආපසු භාර නොදීම
ආ). භාර දෙනු ලැබූ මායිම් ගල් විධිමත් ලෙස පියවීමට නොහැකි වීම
ඇ). අදාල ගිවිසුම ප්‍රකාරව නියමිත දිනට වැඩ අවසන් කර භාර නොදීම
ඈ).මැනුමේ සහ සකස් කරන ලද පිඹුරේ නියම කරනු ලැබූ සංශෝධන සිදු කිරීමට අපොහොසත් වීම
ඉ). නීත්‍යානුකූල නොවන අන්දමින් ක්ෂේත්‍ර මැනුම් කටයුතු සිදුකිරීම
ඊ). ඉහත සදහන් තත්ත්වයන්ට අමතරව වෙනත් කොන්දේසි කඩ කිරීමක් සිදු කිරීම

තවද සිදු වී ඇති වෘත්තීය විෂමාචාරයන් පිළිබදව මිනින්දෝරු වරයාට එරෙහිව මැනුම් සභාව වෙත දැන්වීමට සේවාදායකයා කටයුතු කරනු ඇත. මෙයට අමතරව මිනින්දෝරුවරයාගේ නම දෙපාර්තමේන්තු වැඩ සැපයීම යටතේ අසාධු ලේඛන ගතකිරීමට සර්වේයර් ජනරාල් වරයාගේ අභිමතය පරිදි කටයුතු කරනු ඇත.